**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

රත්නපුරදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරවදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021ජුනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලනොවීම**

----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 3.1 ඡේදයට පටහැනිව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව භාණ්ඩාගාර පොත්වල සඳහන් එකතුව රු. 8,278,629 ක ආදායම් මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට වග බලා ගන්නා බව. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය ගිණුම්චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06හි3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂය අවසානයේ වූ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වර්ෂයේ වෙනත් ලැබීම් වටිනාකමරු. 236,984,344ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එම වටිනාකමරු.271,696,668ක් ලෙස සටහන් කිරීමෙන්රු.34,712,324කින් වෙනත් ලැබීම් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එක් වියදම් විෂයක රු. 823,093 ක වියදම අඩුවෙන්ද තවත් වියදම් විෂයයකරු. 8,471 ක වියදම් වැඩිවෙන්ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට වග බලා ගන්නා බව. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය ගිණුම්චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06හි3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා කෙරීගෙන යන වැඩ ශේෂයන්ගේ එකතුවඑදිනට භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි ඒකාබද්ධ ගිණුම් සාරාංශයේ ස්ථාවර වත්කම් ලෙජර්න්හි සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කර තිබූ කේවල මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශන්හි(ඒසීඒ6) ශේෂයන් හා සැසඳීමේදී පිළිවෙලින්රු.32,953,600ක,රු. 38,953,502ක සහ රු. 5,710,399ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බවත්, ඒකී නිවැරදී කිරීම් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට උපදෙස් දීමට සටහන් කරගත් බව. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි නිසි ලෙස පොත් පත් සහ වාර්තා පවත්වා ගැනීමත් සන්සන්දනයක් සිදු කිරීම මඟින් නිවැරදිතාවය තහවුරු කර ගැනීමත් කළ යුතු වේ. |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අපහරණයන් මගින් පිරිවැය රු. 544,543ක් ඉවත් කර තිබූ නමුත් එම වත්කම් විකිණීම මගින් ජනිත වූ සත්‍ය මුදල් ගලාඒම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් මගින් ජනිත වූ මුදල් ගලාඒම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ආදායම් හඳුනා ගෙන අදාල පරිදි කටයුතු කරන බව. | වත්කම් විකිණීමෙන් ජනිත වූ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වශයෙන් දැක්විය යුතු වේ. |
| (ආ) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ගලාඒම්වල තැන්පතු ලැබීම් යටතේ හෙළිදරව් කළයුතු ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මුදලින් ලද රු.108,030ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ගලාඒම්වල වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් යටතේ දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුල නිරවුල් කර තිබූ මෙම තැන්පතු ශේෂය සම්බන්ධයෙන් මූල්‍යප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනට වූ තැන්පත් ගිණුම් පිළිබඳව ප්‍රකාශයේ (ඒසීඒ4) හෙළිදරව්කරද නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට වග බලා ගන්නා බව. | තැන්පතු ලැබීම්මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍යක්‍රියාකාරකම්වශයෙන් දැක්විය යුතුය.තවද මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතු වේ. |

### 1.6.5 අක් මුදල් ගැලැපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අක්මුදල් ගැළපීමේ ගිණුමේ හරට සටහන් කළ යුතු අයිතමයන්හි එකතුවේ රු. 1,324,439ක වෙනසක්ද, බැරට සටහන් කළ යුතු අයිතමයන්හි එකතුවේ රු. 25,923,877ක වෙනසක්ද නිරීක්ෂණය විය. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණෙන් රු. 3,076,466 ක් වටිනා බැරකම් පිළිබඳ විගණනයට තහවුරුවක් නොවීය. | බැරකම් වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ශීර්ෂ 278 සඳහා සැලසුම අනුව ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු. 2,149,795,347ක් අඩුවෙන් අග්‍රිම ලැබී තිබුණි. මේ අනුව වැඩසටහන් 03 ක් යටතේ ගිවිසුම්ගත මුදල රු.මි 99.6 ක් වූ ව්‍යාපෘති 150කින් 149ක වැඩ අවසන් වී තිබුණද, අක් මුදල් නොමැති වීම හේතුවෙන්2019 හා 2020 වර්ෂ තුළ රු.මි 88ක මුදලක් ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බව. | භාණ්ඩාගාරය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කළමනාකරණය මනා ලෙස සිදුකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදය අනුව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුල බැඳීම් හඳුනාගත යුතු වුවත්, සීමාව ඉක්මවා එකතුව රු. 2,183,376ක් වූ බැඳීම් සඳහා එළඹ තිබුණි. | වර්ෂ අවසානයට පසුව වියදම් හඳුනා ගැනීම නිසා එම වියදම් බැරකම් ලෙස සටහන් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය සීමාව තුළ බැඳීම් හඳුනාගත යුතු වේ. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16කට වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 40කින් අවශ්‍යතා 82ක් සඳහා ලබාදුන් රු. මිලියන 400.8ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේරු. මිලියන 138ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩසටහන් පැවැත්වීමට සහ වියදම් දැරීමට නොහැකි වීම,බිල්පත් ඉදිරිපත් නොවීම, අක්මුදල් නොලැබීම,සියළු බිල්පත් ගෙවා අවසන් වූ පසු ඉතිරි වූ මුදල් පැවතීම යනාදිය හේතු වූ බව. | අදාල රේඛීය අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා මහා භාණ්ඩාගාරය සමඟ වර්ෂයේ මුල් භාගයේ සිටම නිරන්තර සම්බන්ධයකින් යුක්තව කටයුතු කර ව්‍යාපෘති සඳහා වෙන්කල ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතු වේ. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්,එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ පවතින තත්ත්වය පිළිබඳව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම්වලදී සමාලෝචනය කර එහි පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කල යුතු වේ. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල්රෙගුලාසි 571 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12කට අදාළව වර්ෂ 02ක් ඉක්ම වූ රු.38,304,767 ක් වටිනා තැන්පතු 83ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අක්මුදල්ප්‍රමාණවත් නොවීම,බිල්පත් ඉදිරිපත් නොවීම,අදාල වාර්තා ලද පසු රැඳවුම් මුදල් නිදහස් කරන බව,රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරන බව, ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව යනාදී වශයෙන් පිළිතුරු ඉදිරිපත් කර තිබීම. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11කට අදාලවවාහන 30ක්සම්බන්ධයෙන් අදාල විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | කඩිනමින් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් ආයතනයේ ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත ඉලක්කය වෙත ලඟා වීමට ආයතනික කාර්ය මණ්ඩලය යොදවා ගන්නා ආකාරය සහ නිපුණතා පරතරය හදුනාගෙන එම පරතරය අවම කිරීමට ඉවහල් වන ආකාරයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට උපදෙස් දී ඇති බව. | චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

(ඇ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

--------------------------

| | | | |
|---|---|---|---|
| (i) 3.2 වගන්තිය | සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම්, වැඩ, කොන්ත්‍රාත් පැවරිය හැකි වුවද, එකී විධිවිධානවලට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක පිරිවැය රු. 2,544,483 ක් වටිනා කර්මාන්ත 04 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් මූල්‍ය හැකියාවක් නොමැතිව ප්‍රජා පාදක සංවිධාන වෙත කොන්ත්‍රාත් පවරා දී තිබුණි. | නිවිතිගල ප්‍රාදේශීය ලේකම්කාර්යාලයට අදාලව,ණය පදනම යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව වාචිකව ප්‍රකාශ කිරීම නිසා ද වෙනත් ක්‍රියාකාරී සමිතියක් නොතිබූ බැවින්ද ක්‍රොන්ත්‍රාත් ප්‍රදානය කල බවත් අයගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලවබැංකු ගිණුම්වල මූල්‍ය හැකියාව පරීක්ෂා කරන බවද වශයෙන් පිළිතුරු ඉදිරිපත් කර තිබීම. | චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) 3.2 (iv) ඡේදය | ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව රු.4,840,393 ක් වටිනා ව්‍යාපෘති 09ක් යොමුගත චක්‍රලේඛයට පටහැනිව උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | එවැනි උප ක්‍රොන්ත්‍රාත් ලබාදීමක් පිළිබඳව වාර්තා වී නොමැති බවත්, ව්‍යාපෘතිය උප ක්‍රොන්ත්‍රාත් ලබාදීමට නොහැකි බවට ප්‍රකාශයක් ලබාගෙන ඇති බවත්ය. | චක්‍රලේඛයේ3.2 (iv) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මිල ගණන් කැඳවීම මඟින් සුදුසු ලංසුකරුවෙකු තෝරා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් එකී විධිවිධානවලට පටහැනිව වාහන 06 ක රු.378,473ක් වටිනා සේවා කටයුතු සඳහා ගෙවා තිබුණි. | ගුණාත්මකභාවයෙන් යුතු සේවාවක් ලබා දෙන ප්‍රදේශයේ පිහිටි එකම සේවා ස්ථානයෙන් වාහන සේවා කිරීම සිදු කල බවද, ප්‍රාදේශීයලේකම්ගේ රු.25,000 බලය දීම සීමාව යටතේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව සේවා කිරීම් කල බව ද යනාදී වශයෙන් පිළිතුරු දී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස 2011/01 දරන අපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 ඡේදය | නාය යෑම් අවධානම් දිස්ත්‍රික්කවල ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අදාළ යෝග්‍යතා සහතිකය/ නිර්දේශය ලබා ගැනීම අනිවාර්යෙන්ම සිදුකළ යුතු නමුත් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව රු.34,913,401 කඉදිකිරීම 02 ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල මුල් ඉදිකිරීම් 2016 වර්ෂයේ දී සිදු කර ඇති බවත් ඒ වන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණසංවිධානයෙන් නිර්දේශ ලබා ගැනීම අවශ්‍ය වී නොතිබුණ බවත්, ජාතික ගොඩනැගිලි පර්යේෂණසංවිධානයේ වාචික එකඟතාවය මත ඉදිකිරීම් කල බවත් ඊට අදාල ලිඛිත එකඟතාවයේ පිටපතක් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බවත් දන්වා තිබුණි. | 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස 2011/01 දරන අපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 03 ඡේදය | තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයකු මියගියහොත් දින 07 ක් ඇතුලත විශ්‍රාම වැටුප් අංකය සහිතව ඒ බව වහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වසම්භාර ග්‍රාම නිලධාරී විසින් දැනුම් දිය යුතු වුවත්,එසේ නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාලව මිය ගිය විශ්‍රාමිකයින් 33 දෙනෙකු වෙත ගෙවන ලද රු.1,258,277 ක විශ්‍රාම වැටුප් මුදල් අය කර ගත යුතුව තිබුණි. | මේ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන ලද බවත්,වැඩිපුර ගෙවීම් කර ඇති මුදල අය කර ගැනීමට කටයුතු යෙදා ඇති බවත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලක්වා කටයුතු කරන බවටත් දන්වා තිබුණි. | චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2020 දෙසැම්බර් 21 දිනැති අංක 2020/02 දරන රත්නපුර දිස්ත්‍රික් ලේකම්ගේ අභ්‍යන්තර විගණන උපදෙස් ලිපියෙහි 02 ඡේදය | වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල කොන්ක්‍රීට් සම්පිණ්ඩන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සමස්ත ව්‍යාපෘතිවලින් අවම වශයෙන් සියයට 25 ක අනිවාර්යයෙන්ම හැමර් පරීක්ෂාව සිදු කළ යුතු අතර, සෑම කොන්ත්‍රාත්කරුවකුගෙන්ම අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් ඇතුළත් වන පරිදි තෝරාගැනීම සිදුකළ යුතුය. එසේ වුවද එක් ව්‍යාපෘතියක්වත් හැමර් පරීක්ෂණයට ලක් නොවූ කොන්ත්‍රාත්කරුවන් 10 දෙනෙකු වූ අතර ඔවුන් සමග ගිවිසුම්ගත ව්‍යාපෘති 18 ක් විය. ඒවායේ වටිනාකම රු.10,479,208 ක් විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක් සඳහා එක් හැමර් යන්ත්‍රයක් පමණක් තිබීම,පැවති අධික වර්ෂාව හේතුවෙන් මාර්ග ජලයෙන් තෙත්ව පැවතීම යනාදිය හේතු වූ බව | අභ්‍යන්තර විගණන උපදෙස් ලිපියෙහි 02 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජූනි 27 දිනැතිඅංක 05/2019 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සහ 2020 අගෝස්තු 28 දිනැති අංක01/2020 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසෙහි 3.1 ඡේදයේ මුදල් රෙගුලාසි 113(6)(ආ) යන උපදෙස් ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම මඟින් ලබා දුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුවද,ස්ථාන මාරු වීගිය නිලධාරීන්02 කටද, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් 07 කටද,සේවය අතහැර ගොස් මාස 05 සිට මාස 15 කට වඩාකල් ගත වී තිබුණු නිලධාරීන් 03 කටද, මිය ගොස් මාස 04 ක් කල් ගත වී තිබූ නිලධාරියෙකුටද, අවසාන වාරික අයකර මාස 03 සිට අවුරුදු 12කට වඩා කල් ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 05 කටද, අවුරුදු 02 කට වඩා කල්ගත වී තිබුණු අසනීප තත්ත්වය හේතුවෙන් සේවයට වාර්තා නොකරන නිලධාරියෙකුට ද ගෙවා තිබූ රු.2,303,305ක මුදල සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන්ට ගෙවීම් කරන ලෙස ලිඛිතව දැනුවත් කල බවද ඉදිරියේදී නිරවුල් කරන බවටදඅදහස් දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට අදාළව කර්මාන්ත 109කින් ලබාගත් රැඳවුම් මුදල් රු.6,335,702ක් දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් විගණිත දිනය වූ 2021පෙබරවාරි 02 දින වන විට මාස 06 සිට මාස 34 ක් ගත වී තිබුණද, ඒවා නිදහස් නොකර තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බවත්,ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අග්‍රිම නොලැබීමත් යනාදී වශයෙන් අදහස් දක්වා තිබුණි. | දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් ඇති රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම්සමාලෝචනය

### 3.1 අපේක්ෂිත කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 දෙසැම්බර් 06 දිනැති සංවර්ධන චක්‍රලේඛ අංක 01/2019හි 04 ඡේදය ප්‍රකාරව තරුණ තරුණියන් සහ කාන්තාවන් අතර ස්වයං රැකියා ජනනය කිරීමට උපකාරී වන ව්‍යාපෘති මෙන්ම අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමට ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු විය. එහෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17හි ග්‍රාම නිලධාරී වසම් 575ක් තුළම මෙලෙස විශේෂ අවධානයක් යොමු කිරීමෙන් තොරව රු.මිලියන 1259.98ක් වූ භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2291ක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ග්‍රාමීය ප්‍රජාවගේ රැකියා හා ජීවනෝපාය අවස්ථා වර්ධනය කිරීමට සැළකිය යුතු දායකත්වයක් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | යටිතල පහසුකම් සංවර්ධනයත් සමඟ කෘෂිකාර්මික, ස්වයං රැකියා උත්පාදනය ආදී වැඩසටහන් ක්‍රියාත්මක විය යුතු බවත් ඒ සඳහා විශේෂ වූ වැඩසටහන් ක්‍රියාත්මක කළයුතු බවත්ය.එසේ නොමැතිව පොදු වැඩසටහන් යටතේ මෙම ක්ෂේත්‍රද ආවරණය කරන ලෙස උපදෙස් දුන්නද ග්‍රාමීය කමිටුවලදී සිදුවනුයේ බහුතරයකගේ අවශ්‍යතාවය වන ග්‍රාමීය මාර්ග යෝජනා ඉදිරිපත් වීමත් බවය. | ඉදිරි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ----------- |
| 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් සඳහා බලපත්‍ර/දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී,ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක ඉඩම්කච්චේරි නොපැවැත්වීමත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 01 සිට 07ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08කට අදාළව අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නියමානුකූල කිරීම සඳහා ඉඩම් හඳුනා නොගැනීමත්, තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් කොට්ඨාශයට අදාළ රජයේ ඉඩම් කැබලි සංඛ්‍යාව හා අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නිශ්චිතව හඳුනාගෙන නොතිබීමත් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි. තවද, මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන අනුගමනය කර නොතිබූ බවද නිරීක්ෂණය විය. | රජයේ ඉඩම් සඳහා බලපත්‍ර/දීමනාපත්‍ර ලබාදීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම් විසින් තනිව සිදු කරනු ලබන කාර්යයක් නොවන බවත්,ඒ සඳහා සම්බන්ධිත අනෙකුත් ආයතනවලින් ලැබෙන සහයෝගය මත ප්‍රමාදයන් ඇති වන බවත්ය. | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

-----------------------------------------

රත්නපුර දිස්ත්‍රික්කයේ නව සමෘද්ධි සහනාධාර වැඩසටහන සඳහා අයදුම්කරුවන්54,489කගෙන්ඉල්ලුම්පත්‍ර ලැබීමෙන් පසු එම අයදුම්පත් සමාලෝචනය කර ප්‍රමුඛතා අනුපිළිවෙලට ප්‍රතිලාභීන් 39,199 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර, ඒ අනුව 2019 අගෝස්තු 31 දිනටප්‍රතිලාභීන් 24,715 දෙනෙකු සඳහා හිමිකම් සහතිකපත්‍රපිරිනමා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------- | ----------- |
| (අ) | වසමේ සිටින වඩාත් සුදුසුම සහ ප්‍රමුඛතම අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් වෙත සමෘද්ධි සහනාධාර හිමිකම්පත් ලබා දිය යුතු නමුත් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 හි හිමිකම්පත්ලාභීන් තේරීමේදී ප්‍රමුඛතා ලේඛනයේ අග සිටින ප්‍රතිලාභීන් 6,949ක් එනම්, සියයට 27කට සහ ඒ අතුරින් ග්‍රාම නිලධාරී වසම් 07ක ප්‍රමුඛතාවය කිසිසේත්ම නොසළකා ප්‍රමුඛතා ලේඛනයේ අග සිටින ප්‍රතිලාභීන් 137 දෙනෙකු වෙත සමෘද්ධි සහනාධාර හිමිකම් ලබා දී තිබුණි. තවදපදනම් කරගත් නිර්නායකයන් මත ග්‍රාමීය කමිටුව විසින් දරිද්‍රතාවයේ අනුපිළිවෙලට පෙළගස්වන ලද නාම ලේඛනයේ මුල් ස්ථානවල නම් සඳහන් වී ඇති නමුත් අමාත්‍යාංශය විසින් එවන ලද නාම ලේඛනයේ නම ඇතුළත් නොවූ අවස්ථා 101ක් නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 මාර්තු 31 වන විටත් ගෙන නොතිබුණි. | ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා එකඟ වන බවත්,ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ප්‍රාදේශීය ලේකම් වෙතින් ලද සියළු නාමලේඛන දිස්ත්‍රික් කාර්යාලය විසින් සමෘද්ධි සංවර්ධනදෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට යොමු කරන ලද බවත් ඉන් හිමිකම්පත්ලාභීන් තෝරා ගනු ලැබුවේ ප්‍රධාන කාර්යාලය විසින් බවත්ය. | ප්‍රමුඛතා අනුපිළිවෙලට ප්‍රතිලාභීන් තෝරා ගෙන සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | වසමේ කිසිදු කුටුම්භයකට නව සහනාධාර හිමිකම් නොලැබී තිබුණු සහ එසේ නොලැබීමට පැහැදිලි තාර්කික හේතුවක් රහිත දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව වාසය කරන ග්‍රාම නිලධාරී වසම් 04ක් නිරීක්ෂණය විය. එසේ වුවද, ප්‍රමුඛතාවය ලබාදිය යුතු එම වසම් සම්බන්ධයෙන් අවධානය යොමු නොකර නිර්දේශ කළ සියළුම පවුල් ඒකක සඳහා සහනාධාර හිමිකම් ලබා දී තිබුණු වසම් 57ක් නිරීක්ෂණය විය. | ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා එකඟ වන බවත්,ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ප්‍රාදේශීය ලේකම් වෙතින් ලද සියළු නාමලේඛන දිස්ත්‍රික් කාර්යාලය විසින් සමෘද්ධි සංවර්ධනදෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට යොමු කරන ලද බවත් ඉන් හිමිකම්පත්ලාභීන් තෝරා ගනු ලැබුවේ ප්‍රධාන කාර්යාලය විසින් බවත්ය. | ප්‍රමුඛතා අනුපිළිවෙලට ප්‍රතිලාභීන් තෝරා ගෙන සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැයරු. 2,087,738 ක් වූ ව්‍යාපෘති 06ක් නිම නොකර අත්හැර දමා තිබුණි. | පැවති අධික වර්ෂාව හේතුවෙන්ද,ද්‍රව්‍ය ප්‍රවාහනයේදී සිදු වන අපහසුතාවය නිසාද, කොවිඩ්-19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන්ද, කාලය ප්‍රමාණවත් නොවීමද ආදී වශයෙන් හේතුන් දක්වා තිබුණි. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02කට අදාලව ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කළ ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 76.1ක් වූ ව්‍යාපෘති 02ක ඉදිකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඊට අදාළව වෙන් කළ ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු.මිලියන 22.9ක් හෙවත් සියයට 30ක් විය. | ඉඩම් හිමියන් වරින්වර විරෝධතා දැක්වීම,අධික වර්ෂාව, කොවිඩ්-19 වසංගත රෝග තත්ත්වය,සම්පිණ්ඩන ශක්තිය මැන බැලීමට ප්‍රමාණවත් කාලයක් නොවීම,මේ වන විට බිල්පත් යම් ප්‍රමාණයකට ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව ආදී වශයෙන් අදහස් දක්වා තිබුණි. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වසර 04 හා සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16කට අදාළව දිස්ත්‍රික්කයේ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2037ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් යෝග්‍ය ඉඩම් ලබාදුන් පවුල් සංඛ්‍යාව 1151ක් හෙවත් සමස්තයෙන් සියයට 57 ක ප්‍රතිශතයක් විය. | ඉඩම් අත්පත් කර ගැනීමට දිගුකාලයක් ගත වීම,යෝග්‍ය ඉඩම් නොමැති වීම,අත්පත් කර ගත් ඉඩම්වල පදිංචියට ප්‍රතිලාභීන්ගේ ඇති අකමැත්ත,සුදුසු ඉඩම් හෝ නිවාස සහිත ඉඩම් සොයා ගැනීමට ප්‍රතිලාභීන්ගේ ඇති ප්‍රමාදය ආදී කරුණු හේතු වූ බව | දැනට අත්පත් කරගෙන ඇති ඉඩම්වල මිනින්දෝරු වාර්තා කඩිනමින් ලබාගෙන ඉතිරි පවුල් සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා හෝ ඉඩම් ලබාදීමට පියවර ගත යුතු වේ. |
| (ඇ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ඉකුත් වසර 04 හා සමාලෝචිත වර්ෂය තුළ ගංවතුරින් හා නායයාම්වලින් හානියට පත් මුළු නිවාස ගණන 18240ක් වූ අතර ලබාදිය යුතුව තිබූ මුළු වන්දි මුදල රු. 1,095,644,890ක් වුවද,2020 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ලබාදිය යුතු මුදලරු.362,553,915ක්ව පැවතුණි. | ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කර ඇති වන්දි මුදල් මෙතෙක්නොලැබීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තක්සේරු කමිටු විසින් සිදුකරන තක්සේරු වටිනාකම,ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සංශෝධනය කිරීම හෝ තක්සේරු කරන මුළු වන්දි මුදලම නොලැබීම වශයෙන් හේතු දක්වා තිබුණි. | භාණ්ඩාගාරය හා අදාළ රේඛීය අමාත්‍යාංශය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අදාළ වන්දි මුදල් කඩිනමින් ගෙවීමට හැකිවන පරිදි කටයුතු සැලසුම් කළ යුතු වේ. |

**3.6 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක සංවර්ධන වැඩසටහන් 02 කට අදාළව විධිමත් තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කර නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතී දැයි තහවුරු කර ගැනීමකින් තොරව කොන්ක්‍රීට් මිශ්‍රණ අතුරා ඉදිකරන ලද මාර්ග17 කට අදාළව කොන්ක්‍රීට් සන මීටර් ($m^3$) 736.49 ක් සඳහා රු.13,578,524 ක්ගෙවීම් සිදු කර තිබුණි. | මාර්ගය ඉදිකරන කාල වකවානුව වන විට මාර්ගයේ සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර පහසුකම් නොතිබීම. | මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිතසම්පිණ්ඩනශක්තියපව තීදැයි යන්න තහවුරුකරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ඉටුකරන ලද හැමර් පරීක්ෂාවන් 131ක් අතුරින් ගිවිසුම්ගත වටිනාකම රු. 3,394,059ක් වූ මාර්ග 06ක පරීක්ෂණ අසමත් වී තිබුණු අතර, එම මාර්ග සඳහා core cutter පරීක්ෂාවක් සිදුකර ප්‍රතිඵල තහවුරු කර ඉදිරි කටයුතු කිරීමට 2021 පෙබරවාරි 01 විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි. තවද හැමර් පරීක්ෂණය අසමත් වූ ව්‍යාපෘති 06 අතුරින් 05කම ඉදිකිරීම් එකම උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදුකර ඇති බව විගණනයේ දී තහවුරු විය. | core cutter පරීක්ෂාවක් සිදු කරන ලෙසට අදාල සමිති වෙත දැනුම් දී ඇති බව. | එම මාර්ග සඳහා core cutter පරීක්ෂාවක් සිදුකර ප්‍රතිඵල තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සිමෙන්ති ප්‍රවාහනය කිරීමේ දී ආසන්නතම ස්ථාන තිබියදීත් (වෙළෙඳසැල්/හාඩ්වෙයාර්) ඒ පිළිබඳ අවධානය යොමු නොකර බලංගොඩ නගරයේ සිට ප්‍රවාහනය කිරීම හේතුවෙන් විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ කර්මාන්ත 51ක් සඳහා ගෙවීම් කිරීමේ දී ප්‍රවාහන පිරිවැයරු. 525,347ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගන්නා බව. | රජයේ කාර්යයන් ඉටු කිරීමේ දී අරපිරිමැසුම්දායීබව පිළිබඳ විශේෂිත අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය. මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව ද කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ශක්‍යතා අධ්‍යයනයේ දී සහ ඇස්තමේන්තු සකස් කිරීමේ දී මාර්ගයේ භාවිතා කරන වාහන වර්ග, ප්‍රවාහනය කරන ද්‍රව්‍ය, පසෙහි ස්වභාවය සහ ගංවතුර ආපදාවලට ලක්වීම වැනි වැදගත් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරිමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක ඉදිකරන ලද කළ වැඩ වටිනාකම්වල එකතුව රු. 8,485,620ක් වූ මාර්ග 07ක මාර්ග තලය පළුදු වීම්වලට හේතු වී තිබුණි. | බර සීමාවන් ඉක්මවා වාහන ධාවනය කිරීම,ගංවතුරට යට වන ප්‍රදේශ වීම යනාදී වශයෙන් පිළිතුරු ඉදිරිපත් වීම. | ශක්‍යතා අධ්‍යයනයේ දී විශේෂයෙන් අවධානය යොමු කල යුතු කරුණු පිළිබඳව නිසි අවබෝධයකින් යුතුව ක්‍රියාකල යුතු වේ. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව රු. මිලියන දෙක(රු. 2,000,000) නොඉක්මවන ව්‍යාපෘති, ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමෙන් සහ 3.9.4 | ග්‍රාමීය සංවර්ධනයේදී තරහකාරී ලංසු කැඳවීම තුලින් රජයට මුදල් ඉතිරි කර දීමට වඩා ග්‍රාමීය ප්‍රජාවට උපරිම වාසි ගෙන දෙන අයුරින් කටයුතු කල යුතු බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.9.2 සහ 3.9.4 මාර්ගෝපදේශය අනුව රජයට වඩාත් වාසිසහගත වන |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශය අනුව අනුමත සමිතිවලින් සහ දිස්ත්‍රික් ලේකම් විසින් ලියාපදිංචි කර ඇති වෙනත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීම යන විකල්ප ප්‍රසම්පාදන ක්‍රම 02 පිළිබඳ පැහැදිලි උපදෙස් නිකුත් කර තිබුණි. එසේ වුවද, 3.9.4 මාර්ගෝපදේශය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර තරඟකාරීත්වයෙන් රජයට ලබා ගත හැකිව තිබූ ආර්ථික වාසි පිළිබඳව සැළකිල්ලක් නොදක්වමින්ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17හිම සංවර්ධන වැඩසටහන් 02 ක් යටතේ සෘජුවම ඉංජිනේරු ඇස්තමේන්තුවේ රේටයන්වලට රු. මිලියන 02 නොඉක්මවන එකතුව රු.මිලියන 1279.51 ක් වූ ව්‍යාපෘති 2299ක් සෘජුවම ප්‍රජා පාදක සංවිධාන වෙත පිරිනමා තිබුණි. | | අයුරින් කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු වේ. |

**3.7 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර ප්‍රාදේශියලේකම්කොට්ඨාශයට අදාලවනගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මතරු. 33,933,472ක් වැය කර රත්නපුර ශ්‍රී පලාබද්දල නගරයේ ශ්‍රීපාද විශ්‍රාම ශාලාව 2019 ජනවාරි 15 දින ඉදිකිරීම් අවසන් කර 2019 අප්‍රේල් මස 03 දින ජනතා අයිතියට පත් කලද, වන්දනාකරුවන් සඳහා නවාතැන් ගැනීමට හැකි වන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් විගණිත දිනය වූ 2020 දෙසැම්බර් මස වන විටත් යෝජිත අරමුණට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ශ්‍රී පාද වන්දනාකරුවන් සඳහා විවෘත නොකල බව. | අදාල දේපල විධිමත් ලෙස උපයෝජනය කර ගැනීමට පියවර ගත යුතු අතර රජයේ දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීයලේකම්කොට්ඨාශ11ක 1999 වර්ෂයේ සිට භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 44ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වසර 02 කකාලයක සිට භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 04 ක් ඵලදායි කාර්යයකට යොදවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු අතර විගණිත දිනය වූ2021 පෙබරවාරි 04 වන විටත් ගොඩනැගිලි අබලන්ව | රත්නපුරප්‍රාදේශීයලේකම් කාර්යාලයට අදාලවගොඩනැගිලි අළුත්වැඩියා කර ඵලදායී කාර්යයන් සඳහා යොදා ගන්නා ලෙස අදාල ආයතන වෙත දන්වා යවා ඇති | -එම- |

| | | |
|---|---|---|
| පැවතීම,වල්බිහි වී විනාශ වී පැවතීම ආදී කරුණු නිරීක්ෂණය විය. | බවත්,අනෙකුත්ප්‍රාදේශීය ලේකම්කාර්යාල විසින් මෙම ගොඩනැගිලි ඉදිරියේදීඵලදායී කාර්යයන් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු කරන බවත් පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර තිබීම. | |

## 3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේඅංක07/2019 හා 2019 මාර්තු 23 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ඇප තැබිය යුතු නිලධාරීන් 18දෙනෙක් විසින් අදාළ ඇප තැන්පත් කරනොතිබුණි. | ඇප මුදල් තැන්පත් කරන ලෙස අදාල නිලධාරීන්ට දන්වා ඇති බව. | මුදල් රෙගුලාසි 880 හා 881 (ii) ප්‍රකාරව ඇප තැබීමේ කටයුතු සිදු කළ යුතු වේ. |

## 3.9 අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරිදිගල ග්‍රාම නිලධාරී වසමේ තලාව හේන මැදි කිරිදිගල මාර්ග කොටස, බලංගොඩ නගර සභාව සමඟ විධිමත් එකඟතාවයකින් තොරව සහ නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව දිග මීටර් 51.77 ක් වන ලෙස 2017 දෙසැම්බර් 15 දින වැඩ අවසන් කර තිබුණු අතර, මෙම මාර්ගයේ රු.105,324 ක් වැය කර ඉදි කරන ලද පළමු මීටර් 16.14 කොටස මත මීටර් 1.2ක් වනසේ පස් යොදා අනවසරයෙන් ගොඩ කිරීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා නගර සභාව වෙත උපදෙස් දී ඇති බව. | සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සිදු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්නපුරප්‍රාදේශීයලේකම් කාර්යාලයවිසින්රු.961,872 ක් වැය කර කටුගස්ඇල්ල ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කාර්යය 2019 ජූලි 28 වන දින අවසන් කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 25 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නඩත්තුව සඳහා භාර දෙනු ලැබූ ආයතනය (රත්නපුර මහා නගර සභාව) හෝ ක්‍රීඩා සමාජ මගින් නඩත්තු කර නොතිබුණි. ක්‍රීඩාපිටිය සංවර්ධනය කළ පසු ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා නොකොට අතහැර දමා තිබුණු අතරවර්තමානයේදී ප්‍රවේශගත වීමට හෝ නොහැකි පරිදි වල් බිහි වී තිබුණි. | නඩත්තු කටයුතු ක්‍රමාණුකූලව සිදු කිරීම සඳහා නගර සභාව ලිඛිතව දැනුවත් කරන බව. | අරමුදල් උපයෝජනය ඵලදායි සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු වේ. |
| (ඇ) | පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව කරඳවෙල පහළ හකමුව ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු.115,566 ක වැඩ වටිනාකමට 2019 ජූනි 18 දින වැඩ අවසන් කර ඇති නමුත් ව්‍යාපෘතිය නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම හේතුවෙන් මුළු ක්‍රීඩාපිටියම මඩ වී භාවිතා කිරීමට නුසුදුසු මට්ටමක පැවතුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණු අතර ව්‍යාපෘතිය ඉටුකිරීමේ දී නිසිසුපරීක්ෂණයක් සිදු වී නොතිබීම ද මේ සඳහා හේතු වූ බැව් නිරීක්ෂණය විය. | විගණනයෙන් පෙන්වා ඇති කරුණු සමඟ එකඟ වන බවත්,නිරන්තර නඩත්තු කටයුතු කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ සිදු කරන ලෙස අදාළ ක්‍රීඩා සමාජයට දැනුම් දී ඇති බවත්ය. | අදාල වගකිව යුතු පාර්ශවයන් විමසා ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට සුදුසු තත්ත්වයට පත්කිරීමට පියවර ගත යුතු වේ. |

## 3.10 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් 2015 දෙසැම්බර් මාසය වන විටත් අරමුණුගත කාර්යයෙහි යෙදවීමට අපොහොසත් වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථාන 05 ක් ඉදිකිරීමවෙනුවෙන් එම කාල පරිච්ඡේදයතුළ වැය කළ රු.12,952,497 ක්නිශ්ඵල වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එකී ඉදිකිරීම් කටයුතු අවසන් කර අරමුණුගත කාර්යයෙහියෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.ෙ | අදහස් දක්වා නොතිබුණි. | ඉතිරි වැඩ කඩිනමින් අවසන් කර අදාල මධ්‍යස්ථාන උපයෝජනය කිරීමට පියවර ගත යුතු වේ. |

**3.11 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම නිලධාරි වසම් 36කට අදාලව රජයේ ඉඩම්වල ඇති ග්‍රාම නිලධාරි කාර්යාල 33ක්,නිලනිවාසයක් සහ සේවා පියස 02ක ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | රජයේ ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008හි 1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කිරීම,පසුවිපරම සහ ඇගයීම හා වැඩිදියුණු කිරීම සිදු කල යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක2011වර්ෂයෙන් පසුව එම පියවරයන් සිදුකර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008හි 1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17ට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තත්‍ය සේවක සංඛ්‍යාව සමග සැසඳීමේ දී පුරප්පාඩු සේවක සංඛ්‍යාව 167ක් සහ අතිරික්ත සේවක සංඛ්‍යාව 02ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 12ක පුරප්පාඩුවලින් ප්‍රාදේශීය ලේකම් තනතුරු 02ක්, සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 04ක්, සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුරු 04ක්, ගණකාධිකාරී තනතුරු 02ක්ද අනෙකුත් මට්ටම්වල නිලධාරීන්ගෙන් භාෂා පරිවර්තක තනතුරු 06ක්, පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරු 08ක් සහ ග්‍රාම නිලධාරී තනතුරු 68 ක් ද, සංවර්ධන නිලධාරී තනතුරු 28ක් ඇතුළුව පුරප්පාඩු | අදාල තනතුරුවලට බඳවා ගැනීම් අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන බව. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණ කර නොතිබීම, ප්‍රාදේශීය පරිපාලනය විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට බාධාවක් වී තිබූ බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ද්විතියික මට්ටමේ කාර්මික නිලධාරී තනතුරු 18ක, සැලසුම් ශිල්පී තනතුරක සහ තාක්ෂණ සහයක තනතුරු 18ක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම, සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් 08කරු. මිලියන 1398ක් වූ ව්‍යාපෘති 2320ක් සමීපව අධීක්ෂණය කිරීමට සහ නිසි ප්‍රමිතියෙන් යුක්තව නිසිකලට ව්‍යාපෘති නිම කිරීමට බාධාවක් වී තිබූ බව නිරීක්ෂණය විය. | අදාල තනතුරුවලට බඳවා ගැනීම් අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන බව. | -එම- |
| (ඇ) | ද්විතියික මට්ටමේ සංවර්ධන සහකාර තනතුරක් සහ සංවර්ධන නිලධාරී තනතුරක් (පැරණි) අතිරික්තව පැවති නමුත් මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව එම තනතුරු අනුමත කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අනුමත කරවා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අදාල තනතුරු අනුමත කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |